# දුතිය පාරාජිකා

**ගාමෝ -** එක් කුටියක් පරික්ඛිත්ත අපරික්ඛිත්ත අමනුස්ස/මනුස්ස යටත් පිරිසෙන් මාස 4ක් ගැල් කණ්ඩායමක් සිටි තැන.

**අරඤ්ඤං -** ගම ද ග්‍රාමොපචාරය ද හැර සෙසු ප්‍රදෙශය අරඤ්ඤං යැයි හඳුන්වයි.

## පරික්ෂෙපය නොකරන ලද ගෘහයක :-

**ඝරං -** වහලයේ වතුර වැටෙන තැනින් ඇතුලත ගෘහය යැයි හඳුන්වයි.

**ඝරූපචාර - ගෘහයේ නිම්බකොසයෙන් ඇතුලත සිටියා වූ මාගමක් බඳුන් සේදූ දිය විසි කලවිට ඒවා වැටෙන ස්ථානය... ඝරූපචාරය යැයි හඳුන්වයි.**

### පරික්ෂෙපය නොකරන ලද ග්‍රාමයක :-

**ගාමෝ -** අවසන් ගෘහයේ උපචාරයේ සිට මැදුම්පුරුෂයකු විසින් ගලක් විසිකොට වැටෙන තැනින් ඇතුළත ග්‍රාමය යැයි හඳුන්වයි.

**ගාමූපචාර -** ග්‍රාමය පිරිසිඳීම පිණිස විසිකරනලද ගල වැටුන තැන සිට තවත් ගලක් විසිකකොට වැටෙන තැන ග්‍රාමූපචාර යැයි හඳුන්වයි.

### පරික්ෂෙපය කරන ලද ග්‍රාමයක :-

**ගාමූපචාර -** ඉදින් ඒ ග්‍රාමයේ ඉන්ද්‍රඛිලයන් දෙකක් වෙත්ද ඉන්ද්‍රඛිලයෙන් ඇතුළත සිටි මැදුම්පුරුෂයක් ගලක් විසිකරන දුර ගාමූපචාරය යැයි හඳුන්වයි.

**අරඤ්ඤ -** ග්‍රාමයත් ග්‍රාමූපචාරයත් හැර සෙසු ප්‍රදෙශය අරඤ්ඤ යැයි හඳුන්වයි.

**මෙය සීමා පිරිසිදීම් වශයෙන් කියන ලදී, සොරකම කොහෙත් වේ.**

**අදින්නං -** සස්වාමික භාණ්ඩයක් ස්වාමියා විසින් කයින් හො වචනයෙන් හො නොදුන්නේද එය අදින්නං යැයි හඳුන්වයි.

**ථෙය්‍යසඞ්ඛාතං -** සොරකම්කිරීම් සංඛ්‍යාත වූ සොර සිත ථෙය්‍යසඞ්ඛාතං යැයි හඳුනවයි.

**ආදියෙය්‍ය -** පස්විසි අවහාරයන් අතුරින් එක්තරා අවහාරයක වශයෙන් පැහැරගන්නේය.

**පස්විසි අවහාර :-**

1. **නානාභණ්ඩපඤ්චකය**
2. **එකභණ්ඩපඤ්චකය**
3. **සාහත්ථිකපඤ්චකය**
4. **පුබ්බපයොගපඤ්චකය**
5. **ථෙය්‍යාවහාරපඤ්චකය**

### 1. නානාභණ්ඩපඤ්චකය

- ආදියෙය්‍ය
- හරෙය්‍ය
- අවහරෙය්‍ය
- ඉරියාපථං විකොපෙය්‍ය
- ඨානාචාවෙය්‍ය

### 2. ඒකභණ්ඩපඤ්චකය

- ආදියෙය්‍ය
- හරෙය්‍ය
- අවහරෙය්‍ය
- ඉරියාපථං විකොපෙය්‍ය
- ඨානාචාවෙය්‍ය

### නානාභණ්ඩපඤ්චකයෙහි හා ඒකභණ්ඩපඤ්චකයෙහි වෙනස -

නානාභණ්ඩපඤ්චකයේ **සවිඤ්ඤාණක** සහ **අවිඤ්ඤාණක** යන දෙකම කියැවේ.

ඒකභණ්ඩපඤ්චකයේ **සවිඤ්ඤාණක** පමණක් කියැවේ.

- **ආදියෙයා –** දුරනික්ෂෙපයෙන් (අයිතිකරු මට නැවත නොලැබෙයි යැයි සිතින් අයිතිය අතහැරීමෙන්) පාරාජිකාවට පැමිණීම.

උදා:- අන්සතු ආරාමාදියක් තමාසතු යැයි මුසා කියා අභියුඤ්ජනය (පැමිණිලි) කරයි ද **දුකුළා ඇවතක්** වේ.

මෙය මට නොලැබෙයි කියා ස්වාමියාට විමතියක් උපදී ද **ථුල්ලැසි ඇවතක්** වේ.

මෙය මට නොලැබෙන්නේය කියා ස්වාමියා වස්තුව සිතින් අතහරී (දුරනික්ෂෙපය කරයි) ද **පාරාජිකා ඇවතට** පැමිණේ.

- **හරෙයා –** අන්සතු දෙයක් ගෙනයාමේදී පාරාජිකාවට පැමිණීම.

උදා:- අන්සතු දෙයක් හිසෙහි හෝ යම් තැනක තබා ගෙනයාමේදී සොරසිතින් එය අල්ලීම හො අතගෑම කරයි ද **දුකුළා ඇවතක්** වේ. එය සොර සිතින් සොලවයිද **ථුල්ලැසි ඇවතක්** වේ. සොරසිතින් එය තිබූ තැනින් බැහැරට ගනී ද **පාරාජිකා** ඇවතට පැමිණේ.

- **අවහරෙයා –** වෙත තැබූ දෙයක් නැවත ඉල්ලනවිට නොදීමෙන් පාරාජිකාවට පැමිණීම.

උදා:- හිමියා භාණ්ඩය ඉල්ලන විට මා නොගත්තෙමි යැයි කියයි ද **දුකුළා ඇවතක්** වේ. ස්වාමියාට විමති උපදී ද **ථුල්ලැසි ඇවතක්** වේ. දුරනික්ෂෙපයෙන් පරාජිකාවට පැමිණේ.

- **ඉරියාපථං විකොපෙයා –** භාණ්ඩය ගෙනයන්නාහු සමඟ තමාට අභිමත ස්ථානයට ගෙනයන්නෙමි යැයි තර්ජනය කිරීම් ආදියකින් ඔහුගේ මාර්ගය වෙනස්කොට පළමු පාදය තමාට අභිමත දෙසට තබයි ද **ථුල්ලැසි ඇවැත්** වේ. දෙවන පාදය ඉක්මවයි ද පාරාජිකා ඇවතට පත්වේ.
- **ඨානාචාවෙයා –** භූමියක හො පර්වත පාෂාණ ආදියක හො යම් ථලයක තබන ලද භාණ්ඩයක් සොරසාතින් අල්ලයි ද දුකුළා ඇවැත් වේ. එය සොලවයි ද ථුල්ලැසි ඇවැත් වේ. තිබූ තැනින් පහකරයි ද පරාජිකා ඇවතට පැමිණේ.

## 3. සාහත්ථිකපඤ්චකය

- සාහත්ථික
- ආණත්තික
- නිස්සග්ගිය
- අත්ථසාධක
- ධුරනික්ඛෙප

- **සාහත්ථික –** අන්සතු දෙයක් තමන් අතින්ම සොරකම් කිරීම

- **ආණත්තික –** අසවල් භාණ්ඩය සොරකම් කරව යැයි අනුන්ට අණ කිරීම

- **නිස්සග්ගිය – අයබදු අය කරන ස්ථානයකින් අනෙක්පැත්තට භාණ්ඩය පැන්නීම.**

- **අතථසාධක – අසවල් භාණ්ඩය යම් විටෙක සොරකම් කල හැකිද එවිට සොරකම් කරව යැයි භික්ෂුවකට අණ කරයිද ඉඳින් අණ ලැබූ හිමි අන්තරාවක් නැතිව ඒකාන්තයෙන් සොරකම සිදුකරයිද අණ දුන් හිමි එකෙනෙහිම පාරාජිකා වේ.**

- **ධුරනික්ඛෙප –** ආරාමාභියොග උපනික්ඛිත්ත භාණ්ඩ වශයෙන්. තාවකාලික හණ්ඩදෙයා නොදෙන කල්හි මෙයම සිදු වේ.

## 4. පුබ්බපයොගපඤ්චකය

- පුබ්බපයොග
- සහපයොග
- සංවිදාවහාර

- සඞ්කෙතකම්ම
- නිමිත්තකම්ම

- **පුබ්බපයොග –** අසවලාගේ අසවල් දෙය සොරාගනුව යැයි අණ කළවිට ඒකාන්තයෙන් සොරා ගනීනම් අණ කලහු එකෙනෙහිම පරිජි වේ. මෙම ක්‍රමය අණ ලැබූවහු පරිජි වීමට ප්‍රථමව අණකර හිමි පරිජි වන බැවින් පුබ්බපයොග නම් වේ.
- **සහපයොග –** අනුනගේ ආරම ක්ෂෙත්‍රාදිය ස්වකීය ආරාමයට අසුකර ගැනීමට ප්‍රයොග අතුරෙන් අවසන් ප්‍රයොගයේදී පරිජි.

දුකුලා -

ථුලැසි -

- **සංවිදාවහාර –** අසවලාගේ බඩු සොරා ගනිමුයි කිහිපදෙනෙකු සදවිධාන කරගෙන ගොස් එකෙකු හරි සොරකම් කලේ නම් සියල්ලම පරිජි වේ.
- **සඞ්කෙතකම්ම –** අසවල් වෙලාවේදී (දවල්/රෑ) අසවල්දේ සොරකම් කරව යැයි කී විට ඒ වෙලාව නොවරදවා සොරාගන්නෙම්...
- **නිමිත්තකම්ම –** අසවල් දෙය අසවල් සඤ්ඤාව කල කල්හි (ඇස කැසීම් ආදී) සොරාගනුව...

## 5. ථෙය්‍යාවහාරපඤ්චකය

- ථෙය්‍යාවහාර
- පසය්හාවහාර
- පරිකප්පාවහාර
- පටිච්ඡන්නාවහාර
- කුසාවහාර

- **ථෙය්‍යාවහාරය –** යමෙක් උමං කැණීම් ආදියෙන් සොරාගනී නම් /තුලාකූට /මානකූට ආදියෙන් වඤ්චා කොට (බොරු සල්ලිත්) ගනී නම් පරිජි වේ.

- **පසය්හාවහාර –** ගම්පහරන්නකු සේ/ ගම් වර ලත් වූවෙක් අධිකව බදු ගනී නම් පරිජි වේ.

- **පරිකප්පාවහාර –** 1. භාණ්ඩපරිකප්පය - පරිකල්ප වශයෙන් පාත්‍රයක් සොරා ගනිමී යැයි සිතා පසුම්බියක් සොරකම් කරයි නම් පාත්‍රයක් ඇති නම් පරිජි වේ. නැති නම් පරිජි වේ. තියන දෙයක් හොඳයින් පරිජි. ලැබුනු දෙය හොඳයි නම් සිතා තබන පළමු පායෙන් ථුලැසි. දෙවන පාදයෙන් පරිජි වේ.

2.ඔකාසපරිකප්පය - ඉදින් සොරාගන්නවා දකී නම් බැලීමට ආවකු සේ හිඳිම්.

- **පටිච්ඡන්නාවහාර –** වැසීම (සැඟවීම) යම්කිසි භික්ෂුවක් පාරක වටින යමක් දැක පසුව ගන්නෙමි යැයි කොළරොඩු වලින් වසා තබයි ද ඒතාක් අවහාරයක් නැත ඨානාචාවනයක් නැති බැවින්. වස්තු හිමියා හෙට සොයාගන්නෙමි යැයි සිතා ගියවිට සොරාගන්නේ නම් පරිජි වේ. පංසුකූල සඤ්ඤා,සක සඤ්ඤාවෙන් ගනීද නැවත හිමියාට දිය යුතුය. දූරනික්ඛෙප?...
- **කුසාවහාර –** කුසපත්, තමාගේ ගොඩට වඩා වටිනා අනෙකකුගේ ගොඩකට දමයි ද (සොර සිතින්) තමන්ගේ කුසපත දැමූ පමණින් පරිජි නොවේ.අනුන්ගේ කුසපත තමන්ගේ ගොඩට දැමූ විගස පරිජි වේ.

**රාජානො -** බිම්බිසාර රජුටම

**භනෙයායුං -**

**නිදානය -** රජගහ නුවර

**පුග්ගලයා -** ධනිය හිමි

**වස්තුව -** රජුගේ දැව සොරාගැනීම

**ප්‍රඥප්ති -**

**අනුපඤ්ඤත්ති -** ගාමා වා අරඤ්ඤා වා

**ආණත්ති -** සාණත්තික

**විපත්ති -** සකසඤ්ඤා, විස්සාසගාහෙ, තාවකාලික, පෙතපරිග්ගහෙ, තිරච්ඡානගත, පංසුකුල, උම්මත්තක, ආදිකම්මික

**අංග -** 1.අන්‍යයෙකු සතු වීම, 2.අන්‍යයෙකුගේ යන හැඟීම, 3.පාදයක් හො ඊට වැඩි භාණ්ඩයක් වීම, 4.සොර සිත, 5.සොරකම් කිරීම.

**ලොකවජ්ජ**

මාසක 5ක් = පාදයක් , මාසක 1ක් = කලන් ?

(මාසක = මංචාඩි, මස්ස, මසුරම)